# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

ටී.එස් ජයසේන,
වෙදගොඩ, වලකර,
බේරුවල.

**අභියාචක**

**අභියාචනා අංකය : 461/2022**

එදිරිව

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව -
බස්නාහිර පළාත,
අංක 444, ඩියුක් වීදිය,
කොළඹ 01.

**පොදු අධිකාරිය**

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සිටී.
පොදු අධිකාරිය වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ සමූපකාර කොමසාරිස් එච්. විජේවික්‍රම මිය (නම් කළ නිලධාරි) සම්බන්ධ වේ.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නොමැත.
පොදු අධිකාරිය - ඉදිරිපත් කර නොමැත.

**විභාග කළ දිනය** : 2022.07.27

**තීරණය කළ දිනය** : 2022.07.27

**කොමිෂන් සභාවේ තීරණය :**

**අභියාචනයට පසුබිම්වූ කරුණු**

අභියාචක විසින් 2021.08.15 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

> *"2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ වගන්තිය අනුව තොරතුරු දැනගැනීම පනතේ වගන්තියට අනුව තොරතුරු දැනගැනීම පිණිස කරන ඉල්ලීමයි.*

*1. 1973 සමුපකාර රීති මාලාවේ 21(1) (ඉ) වගන්තිය සහ බේරුවල විවිධ සේවා සමුපකාර සමිතියේ අතුරු ව්‍යවස්ථාවේ 22(1) (ඇ) වගන්තිය අනුව සමිතියේ හෝ ලියාපදිංචි කල වෙනත් සමුපකාර සමිතියකින් හෝ ලබාගත් ණයක් හෝ ගෙවිය යුතු වෙනයම් මුදලක් හෝ ආපසු ගෙවීම් පැහැර හැර තිබෙන අයකු ප්‍රාදේශීය කාරක සභාවේ සභිකයකු වශයෙන් තේරීපත්වීමට නොහැක.*

*2. තවද, බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර ප්‍රඥප්තියේ 59 (1) වගන්තිය අනුව පැහැර හරින්නා ලෙස හදුන්වා ඇති අයකු කෙසේවත් නැවත කාරක සභිකයකු වශයෙන් තේරීපත් වීමට නොහැක.*

*3. නිත්‍යානුකූලව එසේ තිබියද මෙම නිතිය පළාත් සභාව විසින්ද සංශෝධනය කර නොමැතිව අදාල නිතිය ක්‍රියාත්මක නොකිරීම කොමසාරිස්තුමියට නීතිමය බලයක් නොමැති බව මගේ පිළිගැනීමයි.*

*4. ණය ගෙවීම පැහැර හැර ඇති අයකුගෙන් එම මුදල් අය කර ගත්තද පැහැර හරිම ඉවත් නොවීම නිත්‍යානුකූලත්වය එසේ තිබිය දී අදාල නීතිය කොමසරිස්තුමිය විසින් එලෙසම ක්‍රියාත්මක කරන්නේ ද යන්න දන ගැනීමට සලස්වන මෙන් ඉල්ලා සිටිමි.”*

මීට ප්‍රතිචාර ලෙස තොරතුරු නිලධාරි 2021.10.14 වන දිනැතිව සඳහන් කර සිටින ලද්දේ,

*“උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් 2021.08.15 දින යොමු කරන ලද තොරතුරු දැනගැනීමේ අයදුම්පත හා බැදේ.*

*02. එම තොරතුරු පහත පරිදි වේ.*
*i. පිලිගනිමි.*
*ii. 1973 සමුපකාර රීති මාලාවේ 21(1) (ඉ) වගන්තියේ සදහන් "පැහැර හැර ඇති කෙනෙක්" සහ 2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරන බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 59(1) වගන්තියේ "පැහැරහරින්නා" යනු අර්ථකතන 02 කි.*
*iii. අදාල නොමැත*
*iv. අදාල නොමැත.”*

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2021.10.31 දිනැතිව නම්කළ නිලධාරි වෙත අභියාචන යොමු කර ඇත.

මීට ප්‍රතිචාර ලෙස නම්කළ නිලධාරි 2021.12.03 වන දිනැතිව සඳහන් කර සිටින ලද්දේ,

*“02. 2021.08.15 දිනැති ඔබගේ ඉල්ලීම ලිපියේ 04 ඡේදයේ කරුණට අදාලව, මා වෙත බාහිර පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් වන කාරකසභිකත්වය පිලිබදව පෙත්සම් හා පැමිණිලි සම්බන්ධයෙන් විභාග කිරීමේදී සමුපකාර ප්‍රඥප්තිය, රීති හා ශ්‍රේෂ්ඨාධිකරණය නඩු තීන්දුවේ දක්වා ඇති නෛතික ප්‍රතිපාදන හා ස්වභාවික යුක්ති මූලධර්ම අනුගමනය කරමින්, පරීක්ෂණ පවත්වා දෙපාර්ශව විමසා, දෙපාර්ශවයේම කරුණු සදහා සවන් දෙමින් කටයුතු කරනු ලබන අතර, බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරන බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 60(2) යටතේ මගේ තීරණය දැනුම් දෙනු ලැබේ.*

*03. ඒ අනුව, කරන සහිකත්වය පිළිබඳ පෙත්සම් විභාගයේදී අනුගමනය කලයුතු නෛතික ප්‍රතිපාදන දක්වා ඇති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවක් වන SC/L/146/2016 දරන නඩු තීන්දුවේ පිටපතක් ඔබගේ වැඩිදුර දැනගැනීම සඳහා මේ සමග ඔබ වෙත යොමු කරමි."*

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2022.01.12 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

**සලකා බැලීම**

අභියාචක විසින් ඉදිරිපත් කර ඇති 2022.08.15 දිනැති උක්ත සඳහන් තොරතුරු ඉල්ලීමේ අඩංගු කරුණු තුළින් නිශ්චිත තොරතුරු ඉල්ලීමක් ස්ථාපිත නොවන බව එකී තොරතුරු ඉල්ලීම පරීක්ෂා කර බැලීමේදී පැහැදිලිව පෙනී යයි. උපකල්පනය කරන ලද කරුණු මත යම් මතයක් ප්‍රකාශ කිරීමට කරනු ලබන ඉල්ලීමක් තොරතුරු ඉල්ලීමක් ලෙසට අර්ථනිරූපණය කළ නොහැක. තොරතුරු ඉල්ලීමක් නිශ්චිත විය යුතු අතර එය පනතේ 43 වන වගන්තියෙහි අර්ථනිරූපණය තුළ පැමිණිය යුතුය. එකී අර්ථනිරූපණය තුළ නොපැමිණේ නම් එවැනි ඉල්ලීමක් තොරතුරු ඉල්ලීමක් ලෙසට නඩත්තු කිරීමට හැකියාවක් නොමැත. එබැවින් මෙම කරුණු සළකා බලා උක්ත සඳහන් තොරතුරු ඉල්ලීම පනතේ 43 වන වගන්තියේ අර්ථනිරූපණය තුළ නොගැනෙන බැවින් වර්තමාන අභියාචනය ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරමු.

මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය ප්‍රතික්ෂේප කරන ලදී.